# බෞද්ධ වාස්තු නිර්මාණය අතර, ලාංකීය චෛත්‍ය නිර්මාණය පිළිබඳව පුළුල් විග්‍රහය.

පූජ්‍ය කැන්දගොල්ලේ ධම්මවිහාරි හිමි*

බෞද්ධ වාස්තු විද්‍යාව තුළින් පැන නැගුණු අනගි කලා කෘතියක් ලෙස ස්තූපය පෙන්වා දිය හැක. ස්තූපය විවිධ නම් වලින් වංසකතා තුළ හඳුන්වා ඇත. ථූප, තුබ, තෝප, ධාතු ගර්බ, දාගැබ, චෛත්‍ය, වෙහෙර අදිය ඒ අතර කැපි පෙනෙයි. චෛත්‍ය බෞද්ධයන්ට පමණක් සීමා වුවක් නොවේ. මන්ද ස්තූපයේ ආරම්භය පිළිබඳ විමසීමේදී ඒ බව වැඩි දුරටත් අවබෝධ වේ. ශ්මසාන තුළින් අරම්භ වූ ස්තූපය නිර්මාණය කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ පවා අනුදැන වදාරා ඇත. පුරාවිද්‍යාත්මක සාධක අනුව ලාංකීය නිර්මාණකරුවන් විසින් නිර්මාණය කළ ප්‍රථම ස්තූපය වන්නේ ථූපාරාමය ස්තූපයයි. මෙසේ ආරම්භ වූ ස්තූප කර්මාන්තය බුබ්බුලාකාර, ධාන්‍යාකාර, ඝණ්ටාකාර, ඝටාකාර, පද්මාකාර, අම්ලාකාර, ප්ලන්ඩාකාර ආදි ආකෘතින් ඔස්සේ නිර්මාණය විය. මෙලෙස ස්තූපය නිර්මාණය කිරීම අසමසම වූ ක්‍රමවේදයන් අනුගමනය කර ඇත. දැගැබ් සැලසුම් කිරීමේ දී යටකී ගර්බ හැඩයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. වෛජයන්ත කෘතිය අනුව සම්පූර්ණ ස්තූපය ඒකක 24කට බෙදයි. පේසාවට ඒකක 5.5 ක් ද, ගර්බයට ඒකක 8ක් ද, හතරැස් කොටුවට ඒකක 2ක් ද දේවතා කොටුවට ඒකක 2ක් ද, කොත් කැරැල්ලට ඒකක 6ක් ද, කොත සඳහා ඒකක 0.5ක් ද විය යුතු බව සඳහන් කර ඇත. එසේ ම උස ඒකක 24ක් වූ ස්තූපයේ විශ්කම්භය 16.5ක් හෝ 15ක් විය යුතු බව සඳහන් කර ඇත. ඉන් අනතුරුව භූමිය තෝරා ගැනීමේ දී මංජු ශ්‍රී වාස්තු භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර නම් කෘතියෙන් තොරතුරු ලබා ගත හැක. එහි ඇතුළත් භූමි වර්ග දහය මෙසේ ය. අනූප, ජාංගල, සාධාරණ, ධූම්‍රක, පූර්ණ, වෛම, භද්‍රක, පද්ම, ඝටිම, පූරිම යනුයෙනි. ඉන් ස්තූප සඳහා අනූප, ජාංගල, සාධාරණ, ධූම්‍රක නම් භූමි සතර පමණක් නිර්දේෂ කර ඇත. මේ සෑම භූමියක් ම එහි මතු පිට ස්වභාවය හා එහි ජීවත් වන ජීවින් හා ශාක අනුව බෙදා දක්වා ඇත. මෙසේ බාහිර ස්වරූපය අනුව තෝරා ගන්නා භූමිය තවත් පරීක්ෂාවට ලක් කරයි. මෙසේ ශක්තිමත් භූමියක් තෝරා ගැනීමෙන් අනතරුව අත්තිවාරම සකස් කිරීම සිදු කරයි. මහාථූපය නිර්මාණය කිරීම පිළිබඳව මහාවංසය කතුවරයා ප්‍රබල විස්තරයක් සිදු කර ඇත. එසේ නිර්මාණය වන ස්තූපයේ මාලක (මේධි), වේදි ( ගරාදි වැට ), ගර්බය. ධාතු ගර්බය, යන්ත්‍ර ගල, හර්මිකාව (හතරැස් කොටුව), යූපය (යෂ්ටිය) ඡත්‍රය, පසු කාලයේ දී, දේවතා කොටුව , කොත් කැරැල්ල, චූඩා මාණික්‍ය ආදිය පිළිබඳව පුළුල ලෙස එහි වාස්තු විද්‍යාත්මක පසුබිම විග්‍රහා කර ගත යුතු ය.

ප්‍රමුඛ පද : ස්තූප, නිර්මාණය, කෘතිය, ඒකක, ගර්භ

* ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය kdhvihari@gmail.com